# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 දෙසැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.50 යි.  තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 60/2002.

**ඛනිජතෙල් ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, සැපයීම සහ බෙදා හැරීම සඳහා විකල්ප කාර්ය පටිපාටියක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, බලශක්ති සැපයුම් කමිටුව වෙත ඇතැම් බලතල පැවරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**2.** ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත පැවරී ඇති බලතල අඩුකිරීම සඳහා නොව ඒ බලතලවලට අමතරව මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක විය යුත්තේ ය.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ බලතල අඩු නොකරන බව.

**3.** බලශක්ති සැපයුම් කමිටුව විසින් මේ පනතට අදාළව මෙහි මින් මතු දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම ද කළ යුතු ය.

බලශක්ති සැපයුම් කමිටුව වෙත මේ පනත යටතේ බලතල පැවරිය යුතු බව.

**4.** ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනතේ 5ආ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ පනතේ 5ආ, 5ඇ, 5ඉ, 5ඊ, 5උ, 5එ සහ 5ඒ වගන්තිවල විධිවිධාන මේ පනතේ මීට පසුව සඳහන් වන විධිවිධාන මගින් බලශක්ති සැපයුම් කමිටුව වෙත පවරා ඇති හෝ වෙන්කර ඇති බලතල සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනතේ ඇතැම් බලතල බලශක්ති සැපයුම් කමිටුවට අදාළ නොවිය යුතු බව.

2—H 016807—4,500 (2002/08)

ඛනිජතෙල් ආනයනය කිරීම, අපනයනය කිරීම ආදිය සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීම.

**5.** (1) අමාත්‍යවරයා විසින් ඛනිජතෙල් ක්ෂේත්‍රයේ අවශ්‍යතා සහ ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන බලශක්ති සැපයුම් කමිටුවේ නිර්දේශය මත ඛනිජ තෙල් ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීම සඳහා යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම, ඛනිජතෙල් ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීම යථාපරිදි පාලනය වන බවට සහතික වීමේ කාර්යය සඳහා බලශක්ති සැපයුම් කමිටුවේ උපදෙස් මත අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට අනුව විධිමත් විය යුතු බවට සහතික විය යුතු ය.

(3) මේ වගන්තිය අනුව නිකුත් කරනු ලබන සම්පූර්ණ බලපත්‍ර සංඛ්‍යාව පළමුවන අවස්ථාවේ දී බලපත්‍ර තුනක් නොඉක්මවිය යුතු ය :

එසේ වුවද මේ වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන බලපත්‍ර සංඛ්‍යාව වැඩි කිරීම ජාතික ආර්ථිකයේ යහපත සහ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාව සඳහා වන බවට බලශක්ති සැපයුම් කමිටුවට පෙනීයන අවස්ථාවක දී එම කමිටුව විසින් ඒ ක්ෂේත්‍රයේ යහපත සැලකිල්ලට ගෙන අවශ්‍ය විය හැකි තැනැත්තන් සංඛ්‍යාවක් වෙත බලපත්‍ර නිකුත් කරන ලෙස අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් අදාළ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ප්‍රදානය කළ යුතු බලපත්‍ර සංඛ්‍යාව වැඩි කරනු ලැබිය හැකි ය.

(4) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව මේ පනතේ කාර්ය සඳහා බලපත්‍රලාභියකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව මේ පනතේ විධිවිධාන ඒ සංස්ථාවට අදාළ වන බවට කියවා තේරුම්ගත යුතු ය.

ඛනිජතෙල් බෙදාහැරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම.

**6.** (1) 5 වන වගන්තිය ප්‍රකාරව ඛනිජතෙල් බෙදාහැරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ දී එසේ බෙදාහැරීම සඳහා භාවිත කරනු ලබන පරිශ්‍රය යම් නියමිත ක්‍රියාකාරකමක් සඳහා යොදා ගැනීමේ ස්වශක්තතාව දැනගැනීම සඳහා විදුලිබල සහ බලශක්ති විෂයය භාර අමාත්‍යවරයා විසින් ආර්ථික ප්‍රතිසංස්කරණ විෂයය භාර අමාත්‍යවරයා විමසිය යුතු ය.

(2) නියමිත ක්‍රියාකාරකමක් යනු නියෝග මගින් කලින් කල නියම කරනු ලැබිය හැකි ක්‍රියාකාරකම් වේ. නියමිත ක්‍රියාකාරකම් පාලනය වන විශේෂ කොන්දේසි ද නියම කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත ප්‍රකාරව ඛනිජතෙල් බෙදාහැරීම සඳහා ප්‍රදානය කරනු ලබන බලපත්‍රයක, බෙදාහැරීම සඳහා වූ බලපත්‍රයකට අදාළ වෙනත් කොන්දේසිවලට අමතරව බෙදාහැරීමට අදාළ ක්‍රියාකාරකම් සහ වෙනත් නියමිත ක්‍රියාකාරකම පාලනය කරන විශේෂ කොන්දේසි ද අන්තර්ගත විය යුතු ය.

(4) ඉදිකිරීම්, සැලසුම් කිරීම් සහ ආරක්ෂාවට අදාළව තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක නිශ්චිතව දැක්වෙන නියමයන්ට අනුකූලව නියමිත ක්‍රියාකාරකම සිදු කළ යුතු ය.

7. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම නියෝගය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

අර්ථ නිරූපණය.

**9.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව" යන්නෙන්, 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පිහිටුවනු ලැබූ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව අදහස් වේ ; සහ

"බලශක්ති සැපයුම් කමිටුව" යන්නෙන්, 2002 අංක 2 දරන බලශක්ති සැපයුම් (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පිහිටුවනු ලැබූ බලශක්ති සැපයුම් කමිටුව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.